Lanka e News

# ‘හෙජිං’ සූදුව ගැන තානාපතිලාගෙන් විමසති

(ලංකා ඊ නිව්ස් -2008, නොවැ.25. ප.ව.4.15) තෙල් සංස්ථාවේ ‘හෙජිං’ තෙල් සූදුවට සම්බන්ධ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ්, සිටි හා ඩොයිෂ් බැංකු බැලූ බැල්මට දූෂණ ගනුදෙනුවකට ඇතුලත්ව තිබීමත්, එම බැංකු වැදගත් ලෙස හා වගකීමකින් කටයුතු කර තිබේද යන ප්‍රශ්නය මතු කරමින් ‘දූෂණ විමසුම’ සංවිධානය වෙනුවෙන් එහි ක්‍රියාධරයන් වන නීතිඥ ශිරාල් ලක්තිලක, නීතිඥ රවි ජයවර්ධන සහ උතුරු මැද පළාත් සභා මන්ත්‍රී රෝහණ ගමගේ මහත්වරුන්ගේ අත්සනින් එම බැංකු තුනේ සාමාන්‍යාධිකාරීවරුනටත්, එම බැංකු තුන අයත්වන රටවල් වන ඇමරිකාව, එක්සත් රාජධානිය සහ ජර්මනියේ තානාපතිවරුන් වෙත ලිපි යවා තිබේ.

‘හෙජිං’ ප්‍රශ්නය ජනතාව අතරට ගෙන යාමට පෙර මෙම කාරණයේදී එම බැංකුවල ක්‍රියාකාරීත්වය කුමක්දැයි දැනුම් දෙන ලෙස එම ලිපි මගින් ඉල්ලා තිබේ.